

# උලූරු (Uluru)
## යුනෙස්කෝ සංස්කෘතික උරුම වනොද්‍යාණයේ සංචාරයක්




ඕස්ට්‍රේලියාවේ, වික්ටෝරියා ප්‍රාන්තයේ, සිංහල සංස්කෘතික සහ ප්‍රජා සේවා පදනම මගින් එහි සාමාජික සාමාජිකාවන් සඳහා සංවිධානය කරන ලද, උලූරු සංචාරය සඳහා මටද සාහභාගී වීමට අවස්ථාවක් ලැබිණ.

UNESCO සංවිධානය මගින් ලෝකයේ රටවල් 167 ක සංස්කෘතික, ඓතිහාසික හෝ ස්වාභාවික උරුම 1073 ක් නම්කර තිබේ. මෙයින් 832 ක් ඓතිහාසික උරුම වන අතර 206 ක් ස්වාභාවික පිහිටීම් වේ. ඉතිරි 35 මිශ්‍ර උරුම ලෙස සැලකේ. (2015 UNESCO සංඛ්‍යා ලේඛන අනුව)
මේ අනුව, ශ්‍රී ලංකාවේද සංස්කෘතික සහ ස්වාභාවික උරුම අටක් නම්කර ඇත.

ඕස්ට්‍රේලියානු කලාපයේ, සංස්කෘතික උරුම 3 ක්, ස්වාභාවික උරුම 12 ක් සහ මිශ්‍ර උරුම 4 ක් හඳුනාගෙන තිබේ.




අපට නවාතැන් සඳහා ලැබුණු ‘Emu walk apartments’

ඓතිහාසික, සංස්කෘතික සහ ස්වාභාවික වැදගත්කම යන කරුණු සියල්ලම නිසා UNESCO සංවිධානය මගින්, ජගත් උරුමයක් වශයෙන් නම් කර ඇති, ඕස්ට්‍රේලියාවේ උතුරු ප්‍රාන්තයේ, මධ්‍ය ප්‍රදේශයේ පිහිටි අති විශාල උලූරු පර්වතය පිහිටි ප්‍රාදේශය උලූරු * කාටා ටිජුටා (Uluru)Kata Tjut) රක්ත කාන්තාර (Red desert), වනෝද්‍යාණය ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබේ. කාටා ටිජුටා නමින් හැඳින්වෙනුයේද උලූරු පර්වතයේ සිට කිලෝමීටර් 30 ක් පමණ දුරින් පිහිටි තවත් පර්වත සමූහයකි.

අප මෙල්බර්න් සිට උලූරු පර්වතයට තරමක් දුරින් පිහිටි යුලාරා (Yulara) නම් කුඩා ගුවන් තොටුපල දක්වා අභ්‍යන්තර ගුවන් යානයකින් ගමන කළෙමු. මෙල්බර්න් සිට යුලාරා දක්වා ගොඩබිමින් යාමට කිලෝමීටර් 2362 ක් තිබෙන අතර මෝටර් රථයකින් එම ගමන යාම සඳහා, පැය 25 ක් පමණ ගතවේ. ගුවන් යානයෙන් ගමනට ගතවනුයේ පැය තුනකට තරමක් අඩු කාලයකි.

අපි 2018 පෙබරවාරි මස තුන්වෙනිදා, අභ්‍යකන්තර ගුවන් ගමන් සේවා යානයකින් මෙල්බර්න් සිට, ඉතා කුඩා යුලාරා ගුවන් තොටට පැමිණෙන විට පස්වරු තුන පමණ විය.

උලූරු ගුවන් තොට වෙත ලඟා වනවිට අහසේ සිට බලන විට තැනිතලා බිමින් ඉහලට නැගී සිටින රක්ත වර්ණ පර්වතය පැහැදිලිව දැක ගැනීමට හැකිවිය. (මෙල්බර්න් සහ උලූරු අතර පැය එකහමාරක පමණ වෙලාවේ වෙනසක්ද ඇත) වනෝද්‍යාන සංචාරයේ ගමන් බිමන් සඳහා ගුවන් තොටෙහි ඇති කුලී වාහන ලබාගැනීමට හැකි විය.

අපට නවාතැන් ගැනීම සඳහා උලාරා ගුවන් තොට ආසන්නයේ පිහිටි සංචාරක ගම්මානයේ " ‘Emu walk apartments’ නම් සියලූ පහසුකම් සහිත නිවාඩු නිකේතන නිවාස වෙන්කර තිබුණි. මෙයින් එක් නිවාසයක හය දෙනෙකුට නතරවීම සඳහා සියලූ පහසුකම් සැපයින. අපි අපගේ ආහාර පාන එම නිවාස වලම සකස් කර ගැනීමට කටයුතු කළෙමු.

දහවල් කාලයේ තද අව් රශ්මිය නිසා අපගේ නැරඹීම් කටයුතු, අලූයම 5.00 ට පමණ ආරම්භ කර, දහවල් 11.00 දක්වාත්, සවස් කාලයේ පස්වරු 3.00 සිට ඉදිරියට රාත්‍රී නවය වනතුරු කළහැකි බවට උපදෙස් ලැබී තිබුණි. ඒ සමගම නිරතුරුවම බිම සඳහා, වතුර බෝතලයක් බැගින් ගෙන යාමද අත්‍යවශ්‍ය බව දන්වන ලදී.

වනෝද්‍යාණය නැරඹීම සඳහා, නිකුත් කළ දින සිට දින තුනක් දක්වා වලංගු ප්‍රවේශ පත්‍ර (එකක් ඩොලර් 25 බැගින්) වනෝද්‍යාණ කාර්යාලයෙන් මිලදී ගතහැකි විය.
පළමු දින සවස් වරුවේ අපට නියමිත වුයේ, හිරු අවරට ගොස් බැස යන අවස්ථාව එළඹෙන විට, උලූරු පර්වතය මත පතිත වන හිරු රැස් පරාවර්තනය මගීන් නිර්මාණය කෙරෙන විචිත්‍ර ආලෝක රටා දර්ශණය දැක බලා ගැනීමයි.

පෙබරවාරි*මාර්තු කාලය ඕස්ට්‍රේලියාවේ ගිම්හාන සමය නිසා, මේ දිනවල හිරු බැස නොපෙනී යනුයේ, පස්වරු අටට පමණය. එදින අපි සියලූ දෙනාම පස්වරු හත පමණ වන විට, එම දර්ශනය නැරඹීම සඳහා පහසු ස්ථානයක්
සොයා ගියෙමු. එදින හිරු බසින වෙලාව පස්වරු අට පසුවී මිනිත්තු දොළහට බව සඳහන් කර තිබුණි.

වනෝද්‍යාණයේ පිවිසුම් දොරටුවද ඉතාමත් දැකුම්කලූ එකක් විය. එය නම්කර ඇත්තේ ‘Uluru)Kata Tjuta’ වනෝද්‍යාණය යන නමින්ය.

අප එහි යන විටත් තවත් සංචාරකයෝ විශාල පිරිසක් හිරු බැසයාමේ දර්ශනය නැරඹීමට සුදුසු ස්ථාන වලට රොක්වී සිටියහ.

එහිදී සන්ධ්‍යාෙ කාලයේ හිරු රැස් වැටී, ලා රක්ත වර්ණයෙන් දිදුලන, උලූරු පර්වතය අපට ඉතා පහසුවෙන් දැක බලා ගැනීමට හැකිවිය.

මෙම පර්වතය කබුක් වැනි, වැලි ගල් පාෂාණ (laterite sandstone) විශේෂයකින් නිර්මාණය වී ඇති අතර, රක්ත වර්ණයක් පවතිනුයේ එහි ෆෙල්ඩ්ස්පාර් (feldspar) නම් ඛනිජය බහුලව තිබෙන නිසාය. ෆෙල්ඩ්ස්පාර් ඛනිජයේ යකඩ මුල ද්‍රව්‍යය (Ferros) අඩංගු නිසා සූර්යාලෝකයට නිරාවරණය වූ විට ඔක්සිකරණය වී පර්වතය මතුපිට රතු පැහැයෙන් යුක්ත යකඩ මළ (ferric oxide) වැනි සංයෝගයක් සෑදෙයි. සම්පූර්ණ භූමියේම පස ගඩොල් රතු පැහැයක් ගන්නේද මෙම රසායනික සංයෝගය නිසාය.

චාරිකාවේ දෙවන දිනය පෙබරවාරි හතර වන දා විය. පෙරදින එක කණ්ඩායමක් ප්‍රමාදවීම නිසා හිරු අවරට යාමේ දර්ශනය ඔවුනට දැකගත නොහැකිවීම ගැන තරමක කනස්සල්ලක් ඇතිවිය.

"හෙට උදේ සියලූ දෙනාම තමන්ගේ උදේ ආහාරයද රැගෙන අපගේ නිකේතන සංකීර්ණයේ ප්‍රධාන දොරටුව අසලට




වනෝද්‍යාණයට ඇතුල්වීමේ දොරටුව.